Sinhalese/සිංහල

ජනමත විචාරණය 2023

# නැවතී සිතන්න

ළඟ එන ජනමත විචාරණයේදී

**මූලාශ්‍ර පිරික්සන්න**

ජනමත විචාරණය අතරතුර, සාක්ෂි මගින් තහවුරු නොවන, සන්ධර්භය මගහැරුනු හෝ හිතාමතාම නොමග යවනසුලු තොරතුරු ඔබට ලැබෙනු ඇත. තොරතුරු පරිශීලනයේදී මනා ලෙස දැනුවත්වීම පිණිස විචාරශීලීව සිතන අයකු වෙමින් තොරතුරෙහි නිවැරදි හා සත්‍යභාවය පිළිබද සැලකිලිමත් වන්න.

## සාවද්‍ය තොරතුරු උපාය මාර්ග

සාවද්‍ය තොරතුරු යනු මහජන මතය හිතාමතාම නොමග යවන හා ඒ මත බලපෑම් ඇති කරවන සැලසුම් සහගත වැරදි තොරතුරු වන අතර, සාවද්‍ය තොරතුරු ස්වයංක්‍රීයව පැතිරෙන්නේද නැත. සාවද්‍ය තොරතුරු පතුරුවන්නට උත්සාහ දරන අය සිතාමතාම ඔබ නොමග පිණිස පහත දැක්වෙන ඇතැම් උපාය මාර්ගයන් යොදා ගනු ඇත:

### හුදෙක් ප්‍රශ්ණ ඇසීම

යමක් පිළිබඳව සාක්ෂි කිසිවක් ඉදිරිපත් නොකර සැකයක් ජනිතකිරීමේ අරමුණින් යමෙකු ප්‍රශ්ණ ඇසිය හැක. අසනු ලබන බොහොමයක් ප්‍රශ්ණ යුක්ති සහගත වුවද, අසද්භාවයෙන් හෝ අස්වාභාවික සිදුවීම් පිළිබද අසනු ලබන ප්‍රශ්ණ පිළිබඳව සැලකිලිමත්වන්න. එවන් ප්‍රශ්නයක් අසනු ලැබුයේ ඇයිද යන්න පිළිබදව නැවතී සිතා බලන්න.

### උද්වේගකාරී භාෂාව

කේන්තිය හෝ භය වැනි අසුබවාදී හැඟුම් ජනිත කරවන උද්වේගකර භාෂාව අන්තර්ගතයන් වහවහා පැතිරවීමට ඉවහල් වනු ඇත. දැඩි හැඟුම්බර ප්‍රතිචාරයක් සඳහා ඔබ පොළඹවනසුලු යමක් දකී නම්, එයට හේතුව නැවතී සිතා බලන්න.

### පක්ෂග්‍රාහී-තෝරාගැනීම්

දුරකතන තිර සේයාරූ (screenshots) හෝ යම් යම් මූලාශ්‍රයන් වෙත යොමු නොකෙරෙන සංඛ්‍යාලේඛණ වැනි, සන්දර්භයෙන් තොරවූ තොරතුරු සංසරණය හරහා පක්ෂග්‍රාහී-තෝරාගැනීම් සිදු වේ.

## චන්දදායකයකු ලෙස ඔබේ කාර්යභාරය

ජනමත විචාරණ නීති සන්නිවේදනයේ හෝ ප්‍රචාරණයේ සත්‍යභාවය නියාමනය නොකරයි. තොරතුරු පහත අයුරුදැයි යන්න සලකා බැලීමට කාලය ගත කරන්න:

**විශ්වසනීය**

### එය විශ්වසනීය හෝ හදුනාගත හැකි මූලාශ්‍රයකින්ද?

තොරතුරෙහි මූලාශ්‍රය ඔබ දන්නවාද? එය බලයලත් මාධ්‍ය ආයතනයකින් හෝ නිල ජනමාධ්‍ය ගිණුමකින් ලැබුනක්ද? ඔබට සැක නම්, ගිණුම මෑතකදී ආරම්භකරන ලද්දක්ද. නැතහොත් එහි තවත් පළකිරීම් ඇත්දැයි සොයා බලන්න.

**යාවත්කාලීන**

### එය පළකෙරුනේ කිනම් කාලයකද?

පළකිරීම/ලිපිය අද දින බෙදාහරිනු ලැබූ නිසාවෙන්ම එය යාවත්කාලීනවූ බවක් අදහස් නොකෙරේ. සැමවිටම මූලික මූලාශ්‍රය සහ පළකිරීමේ දිනය තහවුරු කරගන්න. නැවුම් තොරතුරු සේ පෙනීයන ලෙසට තවදුරටත් නිවැරදි නොවන පැරණි පළකිරීම්/ලිපි බෙදාහැරීමට ඉඩ ඇත.

## AEC හි කාර්යභාරය

AEC යනු ජනමත විචාරණය පැවැත්වීම සඳහා පවරා ඇති ස්වාධීන ආයතනයයි. AEC හි කාර්යභාරය වනුයේ:

### ජනමත විචාරණ ක්‍රියාවලිය පිළිබද විශ්වසනීය තොරතුරු සැපයීම

අපගේ ප්‍රචාරණ ව්‍යාපාරය, වෙබ්අඩවිය, තොරතුරු මධ්‍යස්ථාන සහ සමාජ මාධ්‍ය ගිණුම් තුලින් ලියාපදිංචිවන හා චන්දය ප්‍රකාශකරන අයුරු පිළිබද තොරතුරු සදහා පහසු ප්‍රවේශයක් AEC ලබාදෙනු ඇත. මෙකී ක්‍රියාවලිය මගින් යම් සාවද්‍ය තොරතුරු ඇත්නම්, AEC එකී වාර්තා නිවැරදිකිරීම සදහා කටයුතු කරනු ඇත. මෙකී ක්‍රියාදාමයන්ගෙන් පරිබාහිරව - ජනමත විචාරණ හා සම්බන්ධ සන්නිවේදනයන්හි සත්‍යභාවය පිරික්සීමේ කාර්යභාරයක් AEC වෙත නොමැත.

### ජනමත විචාරණ සන්නිවේදන අධිකාරීන් පිළිබඳ විමර්ශණය

ඔබට තොරතුරක මූලාශ්‍රය දැනගැනීමට සහයවීමට යම් යම් ජනමත විචාරණ සන්නිවේදන බලාත්මක වීම අවශ්‍යය.

### Yes හෝ No ප්‍රචාරණ තොරතුරු

AEC හට Yes හෝ No නිල ප්‍රචාරණය පිළිබඳ තොරතුරු අඩංගු ජනමත විචාරණ පත්‍රිකා නිකුත්කිරීම පිළිබඳ වගකීමක් ඇති නමුදු, මෙකී සන්නිවේදනයන්හි සත්‍යභාවය නියාමනය පිළිබඳ කාර්යභාරයක් AEC වෙත නොමැත.

**aec.gov.au/translated** 1300 720 153

AEC Australian Electoral Commission

AEC23/1804

කැන්බරාහි, මැතිවරණ කොමසාරිස්වරයාගේ අවසරය පරිදිය
Authorised by the Electoral Commissioner, Canberra